

*බණ්ඩාරනායක මැතිණිය සහ යුගෝස්ලාවියා ජනාධිපති ටිටෝ 1971 කොළඹ දී*



*බණ්ඩාරනායක මැතිණියට චීන ජනාධිපති මාවෝ සේතුං හමුවූ අවස්ථාවක්*

**1 වෙනි පිටුවෙන්.........**

# බලන් කඩතුරා හැර දෑසේ

මේ සියළු දෙනා එකතු වී අර මුල සඳහන් අන්ත දෙකටම තදින් බැඳෙමින් හෝ යටත් නොවෙමින් හෝ ලෝකයේ ප්‍රබල තුන්වන බල කණ්ඩායමක් වශයෙන් නොබැඳි ජාතීන්ගේ එකමුතුවක් සාදාගත්හ. බණ්ඩාරනායක මහතා හා ඔහුගෙන් පසු සිරිමාවෝ මැතිණියද ප්‍රමුඛව අප රටද මෙම සංවිධානයේ කැපී පෙනෙන ප්‍රබල වැඩ කොටසක් ඉටු කළෝය. මෙසේ නොබැඳි ජාතීන්ගෙන් ගොඩ නැගුණු මෙය ලොව ප්‍රබල තුන්වන බලවේගයක් බවටද පත්විය. එවකට ධනවාදී සහ සමාජවාදී කඳවුරු දෙකම නොබැඳි ජාතීන්ගේ අදහස් නොවිමසා ලොවට බලපාන පියවරක් නොගන්නා තත්වයක් දිගටම පැවතිණ. අප එදා මේ තුන්වන කඳවුර තුළ හොඳ මිතුරන් රැසක් ඇතිකරගෙන සිටියෙමු.

## ලංකා ඉන්දියා සබඳතා

අසල්වැසියන් වශයෙන් ලංකාව හා ඉන්දියාව අතර කවදත් තිබුණ සම්බන්ධය ඓතිහාසික වශයෙන් විශේෂ තැනක් ගනියි. **1956** න් පසු මෙය අළුත්වැඩියා වූ අතර අප දෙරටම පසුගිය දශක කීපය තුළම ඉන් නිසි ඵල ලැබුවෙමු ඉන්දියාවේ අග්‍රමාත්‍ය ශ්‍රී නේරු තුමා **1950** ගණන්වල අගදී ලංකාවට පැමිණීම විශේෂ තැනක් ගනී. හැටේ දශකය තුළ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ පාලන සමයේ දී ඉන්දියාව සමග මේ සබඳතාවන් නිසා වතුකරයේ ඉන්දීය ජාතිකයින්ගේ ප්‍රශ්නය, කච්චතීවු දූපත් දේශසීමා පැහැදිලි කරගැනීම ආදී ප්‍රශ්න පිළිබඳව ඉන්දියාව සමග සමථයකට පත්වීමට පුළුවන් විය. එවැනි අන්දමින් නිරවුල් පියවරවල් ගැන්මට අපට හැකිකම ලැබුණේ අප නියම හා නිවැරදි ලෙස අපේ මිතුරන් හඳුනාගෙන කටයුතු කළ බැවිනි.

## ලංකා චීන සබඳතා

ලංකා චීන සබඳතා **1950** ගණන් දක්වා ආපස්සට දිවෙයි. ඒ බණ්ඩාරනායක රජයයන් ඇතිවීමට ද පෙර සිට එක්සත් ජාතික පක්ෂ රජය යටතේය. කොරියන් යුද්ධය අවසන් වූ පසු අප රටේ රබර්වලට තිබුණු ඉල්ලුම සහ වෙළඳපොළ නැතිවිය. එකල අප සහලින් ස්වයංපෝෂිතව නොසිටිය බැවින් අපට සහල් ආනයනය කිරීමට සිදුවී තිබිණ. ඒ සඳහා අවශ්‍ය විදේශ විනිමය රබර් වෙළඳාම නැතිවූ නිසා අපට තිබුණේ නැත. මෙහිදී චීනය අපට උදව් වීය. චීනය අපට සහල් සැපයූ අතර, අපි චීනයට රබර් දුන්නෙමු. මේ ගිවිසුම ඒ ප්‍රපාතයෙන් ගොඩ ඒමට අපට උදව් වූවාක් මෙන්ම චීනය අප රටේ කළණ මිතුරෙකු බව ඔප්පු කළේය. බණ්ඩාරනායක යුගයේ තවත් අළුත් වූ මෙම මිතුරුදම චීන අගමැති චෞ එන්ලායිගේ ලංකා සංචාරයේ දී ලක්වැසියන්ගේ හදවත් දිනාගැනීමෙන් තහවුරු විය. සිරිමා බණ්ඩාරනායක මැතිණිය බලයේ සිටි සමයේ මේ මිත්‍රත්වය තව තවත් ශක්තිමත් වූ අතර වෙඩි වැදී මියගිය බණ්ඩාරනායක අගමැතිතුමා සිහිවීම පිණිස චීනය සිය වියදමින් කොළඹ බෞද්ධාලෝක මාවතේ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකර දුන්නාය. ඒ මහා ශාලාව අද එතුමාගේ සිහිවටනයක් වනවා මෙන්ම ලංකා චීන මිත්‍රතත්වයේ නොමියන සංකේතයක් ද වෙයි.

**1976** වසරේ සිරිමා බණ්ඩාරනායක රාජ්‍ය සමයේ දී නොබැඳි ජාතීන්ගේ සමුළුව කොළඹ දී පැවැත්වීම අප ඒ යුගයේ ගොඩනගාගත් නව මිතුරුදම් කොපමණ ඉමහත්දැයි පෙන්නුම් කරන්නක් වීය.

## 1977 ඇරඹුණු ජයවර්ධන සමය

මේ ගොඩනගාගෙන තිබුණු සියළු මිතුරුදම් බිඳවැටුණේ **1977** දී බලයට ආ ජේ. ආර්. ජයවර්ධන පාලන සමයේදීය. ඇමරිකා - බටහිර ගැති විදේශ ප්‍රතිපත්තියක් ගෙනයෑම තුළින් මිතුරුදම් බිඳ වැටිණ. අපි අසල්වැසි ඉන්දියාව සමගද තිබූ මිත්‍රත්වය කඩාගත්තෙමු. ඒ වනවිටත් ගොඩ නැගෙමින් තිබුණු ද්‍රවිඩ ත්‍රස්ත ව්‍යාපාරය මෙය ප්‍රයෝජනයට ගෙන ඔවුන්ගේ හමුදා පුහුණුවට පවා ඉන්දියාවේ සහාය ලද අතර, අන්තිමේ ඉන්දියාව අපට තර්ජනය කරමින් උතුරේ ද්‍රවිඩ ත්‍රස්තයින්ගේ සහායට එමින් යාපනයට ගුවනින් පරිප්පු දැමීමට පවා පෙළඹිණ. එවිට අසරණ වූ ජයවර්ධන රජයට සහාය දීමට කිසිදු විදේශ රටක් නොවීය. ජයවර්ධන පන්දම් ඇල්ලූ ඇමරිකා - බටහිර රටවල් අහක බලාගත්හ. මෙම තත්වය අවසන් වූයේ ජේ. ආර්. ට ඉන්දියාව පස්සෙන්ම ගොස් එවක අගමැතිව සිටි රජීව් ගාන්ධිගේ රජයේ සහාය ගෙන උතුරේ ප්‍රබලව සිටි ද්‍රවිඩ ත්‍රස්ත හමුදා මෙල්ල කිරීමට ඉන්දීය හමුදාව **70** දහසක් අප රටේ භූමියට නිර්ලජ්ජිත ලෙස ගෙන්වා ගැනුණු ඉන්දු ලංකා ගිවිසුමක් පවා අත්සන් කිරීමට සිදුවීමය. නියම මිතුරන් නොතකා වෙනඅය පසුපස යෑමේ අනිසි විපාක පෙන්වා දෙන හොඳම උදාහරණයකි මෙය.

## මහින්ද රාජපක්ෂ සමය සහ නිසි මගට පිවිසීම

මෙසේ අපට සිටි මිතුරන් පවා නැතිකර ගනිමින් අප වැටුණු අසරණ තත්වය නැවත නිසි මගට ගෙන ඒම ඇරඹුණේ **2001** ට පසු බලයට ඒමත් සමගය. නැවත අප ඉන්දියාව හා චීනය සමගද, අප වටා ඇති ආසියාතික රටවල් සමගද මිත්‍රත්ව ගොඩනගා ගනිමින් ඉදිරියට යන්නට පටන් ගැනිණ. එසේම ඉරානය, ලිබියාව, ආදී මැදපෙරදිග ප්‍රබලයන් සමගත්, අද ප්‍රබල තත්වයේ රටක් වන රුසියාව සම ගත් අප මිතුරුදම් බැඳගෙන ඇත. මේ නව මිතුරන්ද ප්‍රතිසංස්කරණය වූ පැරණි මිත්‍රකම් ද පසුගිය ත්‍රස්තවිරෝධී සටන් සමයේ අපට ඉමහත් සහායක් විය. පකිස්ථානය, ඉන්දියාව ඊශ්‍රායෙලය වැනි රටවල්ද අපට විවෘත වම සහාය දුන්හ. එම සහාය නොලැබෙන්නට අපට යුද්ධය ඉතා අසීරුවන්නට තිබුණි.

යුද්ධයේ අවසන් අවධිය වන විට විවෘතවම කොටි ත්‍රස්තයනට උදව් දුන් සමහර බටහිර යුරෝපීය රටවල සහ මහා බ්‍රිතාන්‍යයේ දේශපාලනඥයිනුත් ඇමරිකාව කැනඩාව වැනි රටවලුත් කොටින්ට සහාය දෙමින් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය තුළ **( UN Security Council)** අපට වින කරන්නට දැරූ ප්‍රයත්න ව්‍යවර්ථ වූයේ අද සුපිරි බලවතුන් වන චීනය සහ රුසියාව සිය වීටෝ බලය යොදමින් අපට නියම මිතුරන් ලෙස උදව් දෙමින් කටයුතු කළ බැවිනි. ඔවුන් නොසිටියේ නම් අර සතුරන් අප නැතිකර දමන්නට තිබුණි. එසේ වූවා නම් කොටි ත්‍රස්තවාදීන් අද අප රටේ බලයේ සිටින්නට තිබුණි.


## ඉදිරිගමන සඳහා මේවායින් ලද හැකි පාඩම්

යුද්ධයට පසු දැන් අප රට යුද සමයේ ඉදිරි ගමනක යෙදී සිටි ඉන්දියාව චීනය ආදී කළණ මිතුරන් සමග අපද ඒ ගමනේ යෙදී සිටිමු. නව ඉන්දීය ගනුදෙනු, උතුරට ඔවුන් දෙන ආධාර, චීනය සමග හම්බන්තොට කෙරෙන කටයුතු ආදී මේ සියල්ල එම ප්‍රයත්නයන්ගේ කොටස්ය. එසේම අප බිම හෙළන්නට කටයුතු කළ අපේ සතුරන්ද තවම බටහිර කොටි ඩයස්පෝරාව තුළත්, අප රට අභ්‍යන්තරයේත්, මාධ්‍ය සංවිධාන ආදියේත් නොමඳව ක්‍රියාත්මකව සිටිති. මේ සතුරන් බොහෝ විට හැංගිහොරා කටයුතුවල යෙදෙති. මෙම සතුරු පිරිස් හඳුනාගෙන ඔවුන් පිටු දකිමින් අපේ සැබෑ මිතුරන් සමග ඉදිරියට යෑම අමාරුවෙන් වුවද කළ යුතු දෙයකි.

මේ ලිපියෙන් මෙතෙක් විස්තර වශයෙන් අප පෙන්නුම් කළේ අප රට ශ්‍රීලංකාව වර්තමාන සහ ඉදිරි වෙනස්වන ලෝකය තුළ පැවතිය යුතු ආකාරයයි. අතීතයේ වූ සිදුවීම් තුළින් ඥානය විහිදුවා බැලීමෙන් හරිදේ කුමක්දැයි අපට වටහා ගත හැකිය. අප රටේ අනාගතය ඉදිරියට රැඳී පවතිනු ඇත්තේ අපේ විදේශ ප්‍රතිපත්ති මතය. අද දවසේ ශ්‍රීලංකාව ලබා ඇති පුනර් ජීවනය දෙස බලා, අරඹා ඇති ව්‍යාපෘති දෙස බලා, රට යන්නේ යහපත් අරමුණක් කරා බව වටහාගත හැකිය. මේවායේ ප්‍රථිඵල නෙලන්නේ ඉදිරි පරම්පරාවල්ය. එහෙත් සමහර විවේචකයින්ට මේ කිසිවක් නොපෙනේ. ඔව්හු ඒක පාක්ෂික කඩතුරා වලට මුවාවී සිටින බැවින් හරි දේ නොදකිති. දොස් නගති. ඒ පටල, කඩතුරා ඉවත්කර වෙනස්වන ලොව දෙස බැලිය යුතුය. සැබෑව, යථාර්ථය දකින්නේ එවිට ය.

# පාප් වහන්සේගේ බ්‍රිතාන්‍ය චාරිකාව

**ක**තෝලික ජනතාවගේ මිහිපිට උත්තරීතර නායක පූජකවරය හොබවන 16 වන බෙනඩික්ට් පාප්වහන්සේ දින 4 ක ආගමික සංචාරයක් සඳහා සැප්තැම්බර් 17 වන දින මහා බ්‍රිතාන්‍යයට පැමිණීමට නියමිතය. මෙම ආගමික සංචාරයේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ ලන්ඩනයේ උපත ලැබූ ඉංග්‍රීසි ජාතික ජෝන් හෙන්රි නිව්මන් (John Henry Newman) කාදිනල්වරයා සාන්තුවරයට ඔසවා තැබීමේ (Beatification) චාරිත්‍රානුකූල දේවමෙහෙය පැවැත්වීමය. මහා බ්‍රිතාන්‍යයේ බහුතරය කතෝලික නොවන අතර කිතු බැතිමතුන්ගෙන් **72 %** අයත්වන්නේ එංගලන්ත සභාවටය. **(Church of England)** එසේ වුව ද මෙම




*ජෝන් හෙන්රි නිව්මන් කාදිනල්තුමා*

සංචාරයට බ්‍රිතාන්‍ය රජය තම අනුග්‍රහයද දායකත්වයද ලබාදෙන අතර එංගලන්ත සභාවේ ප්‍රධාන තනතුර නිල වශයෙන් හොබවන මහ රැජිණද හමුවීමට කටයුතු සලසා ඇත. පාප්වහන්සේ විසින් ලන්ඩන් සහ ග්ලාස්ගෝ නගරවල ද සම්ප්‍රදායික දේව මෙහෙයන් පවත්වා බැතිමතුන් ආසිරිගන්වා සැප්තැම්බර් 19 වෙනි දින පෙරවරු 9 යට බර්මිංහැම්හිදී ජෝන් හෙන්රි නිව්මන් පියතුමා සාන්තුවරයට ඔසවා තැබීමේ ප්‍රධාන දේවය මෙහෙය පවත්වනු ලැබේ.

1550 දී 8 වන හෙන්රි රජු විසින් පෞද්ගලික කාරණාවක් මත කතෝලික කිතුණු නිකායෙන් බැහැරවී තමාගේම ප්‍රධානත්වයෙන් එංගලන්ත සභාව පිහිටුවා ගන්නා ලදී. එවක් පටන් අද දක්වාම මහා බ්‍රිතාන්‍යයේ ප්‍රධාන නිකායව ඇත්තේ එංගලන්ත සභාවයි. 1801 පෙබරවාරි 21 වන දින එංගලන්ත සභාවට අයත් ඉංග්‍රීසි පවුලක උපත ලැබූ ජෝන් හෙන්රි නිව්මන් කුඩා කල සිටම ආගමට ලැදියාවක් දැක්වූවෙකි. ඊලිං පාසැලේ මූලික අධ්‍යාපනය ලබා 16 වැනි වියේදීම සුප්‍රසිද්ධ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයට ඇතුළත්වීමට ඔහු සමත්විය. 1820 දෙසැම්බර් මාසයේදී උපාධි ලබා ට්‍රිනිටි විද්‍යාලයේම කථිකාචාර්‍ය්‍ය පදවියද, 1828 දී විශ්වවිද්‍යාලයේ ප්‍රධාන දේවගැතිවරයා ද (Vicar) විය. ඉන්පසු කාල වකවානුව තුළ මෙතුමා ක්‍රමයෙන් එංගලන්ත සභාවේ කටයුතු ගැන කලකිරී ස්වාධීන අදහස් අනුව ආගමික කටයුතු වල යෙදී තිබේ.

ඊට බොහෝ වසර ගණනාවකට පෙර, එනම් 1562 දී පමණ එංගලන්ත සභාවේ කටයුතු පිළිබඳව අප්‍රසාදය පළකළ ඉංග්‍රීසි ජාතික කාදිනල් හා බිෂොප්වරුන්ට සිදුවූයේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාල භූමියේදීම සිරුරට ගිනි අවුළුවා ඝාතනය වීමටයි. එම භයංකර අරගල ගැනද නොතකා ජෝන් හෙන්රි නිව්මන් පියතුමා 1845 ඔක්තෝබර් 9 වෙනි දින කතෝලික නිකායට එක්විය. ඊට පෙරදින එනම් ඔක්තෝබර් 8 වෙනි දින රාත්‍රියේදී පියතුමා ලිට්ල්මෝ (Littlemore) ප්‍රදේශයේ විසූ කතෝලික පියතුමෙකු වන ඩොමිනික් බාර්බරී (Dominic Barbari) හමුවීමට ගොස් ඇත. මෙම රහසිගත හමුවීම වාර්ෂිකව අදද



*බෙනඩික්ට් පාප් වහන්සේ*

වාර්ෂිකව අදද ලිට්ල්මෝ වාසීන් සිහිපත් කරන්නේ සෑම ඔක්තෝබර් 8 වෙනි දින රාත්‍රී 8 ට පමණ ඔක්ස්ෆර්ඩ් නගරයේ සිට සැතපුම් 4 ක් පමණ මග ගෙවා ලිට්ල්මෝ ප්‍රදේශයට පෙරහැරින් පැමිණීමෙනි.

1879 මැයි 12 වෙනි දින කතෝලික පල්ලිය විසින් කාදිනල් තනතුරක්ද පිරිනමා බර්මිංහැම් නගර ආශ්‍රිත කටයුතු පවරා ඇත. ඉන් පසුව වසර **11** ක්ම බර්මිංහැම් ප්‍රදේශයේ අධ්‍යාපනික ආගමික කටයුතු මෙහෙයවා 1890 අගෝස්තු 11 වෙනි දින නිව්මන් පූජකවරයාණෝ ස්වර්ගස්ථ වූහ.

ක්‍රිස්තියානි දහමට අනුව දැඩි ආගම් භක්තියෙන් යුතුව වත් පිළිවෙත් පුරමින් දැහැමිව ජීවත් වූ කෙනෙකු මියගිය පසු ඔවුන්ගේ ආශීර්වාද පතා බැතිමතුන්ට යාඥා කළ හැකිය. එම යාඥාවල් ඉටුවන්නේ නම් එය ආශ්චර්‍ය්‍යයක් (Miracle) සේ සැලකේ. එවිට ඒ බව ඒ ප්‍රදේශයේ පූජකවරුන්ද තවත් පරීක්ෂාවට ලක්කර, ඒ කරුණු සැබෑයයි හැඟේ නම් ඒ බව වතිකානුවට සැලකරන්නේය. එහිදී ඒ මියගිය අය සාන්තුවරයට ඔසවා තැබීමට (Beatification) පාප් වහන්සේට අයිතියක් තිබේ. ඉන් පසුව තවත් එක් ආශ්චර්‍ය්‍යයක් කවදා හෝ ඉටුවූයේ නම් ඒ අය එතැන් සිට සැබෑ සාන්තුවරයෙකු ලෙස බැතිමතුන්ගේ වන්දනා මානයට ලක් වෙනවා ඇත.

මෙවැනි සාන්තුවරයන් සිය ගණනක් කිතුණුවන්ගේ පුද සත්කාර ලබතත් ඉංග්‍රීසි ජාතික සාන්තුවරුන් සිටින්නේ අතලොස් සක් පමණි. එම නිසාම ජෝන් හෙන්රි නිව්මන් පියතුමා සාන්තුවරයට ඔසවා තැබීම බ්‍රිතාන්‍යයට වැදගත් වනු ඇත.

1556 දී පමණ ශ්‍රීලංකාවේ පයාගල ප්‍රදේශයේ විසූ පෘතුගීසි ජාතික ජෝසප් වාස් පියතුමාද 1995 දී සාන්තුවරයට ඔසවා තැබීය. ඒ සඳහා ජුවාම් පාවුළු පාප්වහන්සේ ශ්‍රීලංකාවට වැඩම කළහ.

♦ **මේජර් වී. බී. කරුණාරත්න**
**Major V. B. Karunaratne**
**Littlemore, Oxford, UK**

On September 19, 2010, in Birmingham, England, the long awaited beatification ceremony will take place for the Victorian Catholic theologian, **John Henry Cardinal Newman,** one of the most influential English Catholics of the 19th century. Cardinal Newman will be proclaimed 'a saint' by **His Holiness Pope Benedict XVI** during his papal tour.

At the age of 24, Newman was ordained an Anglican minister in 1825 when he finished his studies at the University of Oxford. In 1845, Fr Newman became a Roman Catholic under Fr. Dominic Barberi, an Italian theologian. Fr Barberi was beatified by Pope Paul VI in 1963.